# 7 ජනගහනය ශ්‍රම බලකාය හා සේවා වියුක්තිය

## 7.1 සමස්ත නිරීක්ෂණ

2002 වර්ෂයේ සියයට 1.5 ක් වූ ජනගහන වර්ධනය, 2003 දී සියයට 1.3 ක් දක්වා පහත් පහත වැටුනි. තවද උතුරු නැගෙනහිර ප්‍රදේශ වල පැවති සාමකාමී තත්ත්වය නිසා තමන් සතු මුල් වාසස්ථාන වල පදිංචියට පැමිණීමට ජනයා තුළ පවතින කැමැත්ත, 2003 වසරේ මඩකලපුව, යාපනය හා ත්‍රිකුණාමලය වැනි දිස්ත්‍රික්ක තුළ වූ ඉහළ ජනගහන සංක්‍රමණ තොරතුරු තුළින් පෙන්නුම් කරනු ලැබීය.

2003 වර්ෂයෙහි පැවති ශ්‍රම වෙළෙඳපොළෙහි සංවර්ධනයන් තුළින් දේශීය ආර්ථික ක්‍රියාකාරකම් වල වැඩිවීම පිළිබිඹු විය. සමස්ථ ආර්ථික වර්ධන අනුපාතිකය වූ සියයට 5.9 ට සමාන්තරව සේවා වියුක්ති අනුපාතිකයෙහි ආන්තික අඩුවීමක් දක්නට ලැබුණි. වඩා නම්‍යශීලී ශ්‍රම වෙළෙඳපොළක් තුළ රැකියා උත්පාදනය සඳහා උචිත වාතාවරණයක් සැකසීමට අවශ්‍යව තිබූ ප්‍රතිසංස්කරණ වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමට 2003 වර්ෂය තුළදී හැකිවිය. එම ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙල යටතේ ක්‍රියාත්මක වූ කම්කරු නීති සංශෝධන ලෙස කම්කරුවන්ගේ රක්ෂාව අවසන්කිරීමේ පනත - 1971, කාර්මික ආරවුල් පනත -1950, කාර්මික ආරවුල් විභාග කිරීමේ හා විනිශ්චය ඉදිරිපත් කිරීමේ පනත සහ කාන්තාවන්, තරුණ පිරිස් හා ළමුන්ගේ සේවා නියුක්තිය පිළිබඳ පනත - 1956 හැඳින්විය හැකි අතර එම සංශෝධන පනත් 2003 ජනවාරි මසදී පාර්ලිමේන්තුවේ දී සම්මත විය. වසරේ මුල් භාගය තුළදී රැකීරක්ෂා හා කම්කරු අමාත්‍යාංශය විසින් කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ පනත 1971, කාර්මික ආරවුල් පනත -1950 හා කාර්මික ආරවුල් විභාග කිරීමේ හා විනිශ්චය ඉදිරිපත් කිරීමේ පනත් ක්‍රියාත්මක දිනය 2003 දෙසැම්බර් 31 ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබීය. කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ පනත 1971 සංශෝධනයෙහි අතිශයින් වැදගත් අන්තර්ගතය වූ වන්දි සූත්‍රය ප්‍රකාශයට පත් කිරීම ද 2003 දෙසැම්බර් 31 වන දින සිදුවිය. රැකියා මූලාශ්‍ර සෙවීමේ හා සැපයීමේ වැඩපිළිවෙලක් ලෙස 2002 වර්ෂයේ ජාතික රැකියා ප්‍රතිපත්ති කෙටුම්පතෙහි සඳහන් කළ රැකියා පියස සංකල්පය 2003 දී ක්‍රියාත්මක කරන ලදී. වෙළෙඳ පොළ සහභාගි වන්නන්හට තොරතුරු ගලායෑම වැඩි කිරීම මගින් ව්‍යුහාත්මක සේවා වියුක්තිය අඩු වීමට සැලැස්වීම රැකියා වෙළෙඳපොළෙහි වැදගත් සංවර්ධනයක් ලෙස සැලකේ. පරිගණක (අන්තර් ජාලය) හා සේවා සැපයීම ආශ්‍රයෙන් සේවා සපයන රැකියා සැපයීමේ ජාලයක් වන මෙය රැකියා අපේක්ෂකයින් හා රැකියා සැපයීමට හැකියාවක් ඇති අයට පහසුවෙන් සම්බන්ධ විය හැකි අතුරු මුහුණතක් සපයයි. රැකියා පියස 2003 මැයි මස 01 වන දින සිට රටෙහි මධ්‍යස්ථාන 17 ක ක්‍රියාත්මක වන අතර පළමු වසරේ අපේක්ෂිත ඉලක්කයන් ද ඉක්මවීය.

මෙම වර්ෂයේ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් කරන ලද රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණයේ

**7.1 රූප සටහන**
**ශ්‍රම බලකාය සහ විරැකියාවේ ප්‍රවණතාවයන් (1999-2002)**




දී, ඇස්තමේන්තු කළ රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ පහත වැටීම මගින් රාජ්‍ය සේවයට බඳවා ගැනීම සීමා කිරීමේ රජයේ ප්‍රතිපත්තිය පෙන්නුම් කරනු ලැබීය. අර්ධ රාජ්‍ය සේවයේ සේවා නියුක්තිය අඩුවීම, මෙම සේවක සංඛ්‍යාවේ අඩුවීමට ප්‍රධාන වශයෙන් බලපාන ලදී. කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය වර්ධනය කිරීමේ අරමුණින් රාජ්‍ය ව්‍යවසායකයන් ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය යටතේ ස්වේච්ඡාවෙන් විශ්‍රාම යෑමේ යෝජනා ක්‍රම වැඩ පිළිවෙල හඳුන්වා දීම සේවා නියුක්තිය පහත වැටීමට ප්‍රධානතම හේතුව විය.

ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව මගින් වසර 15 ක සිට පවත්වාගෙන යනු ලබන කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණ මාලාවේ වෙනසක් ඇති කරමින්, 2003 වර්ෂයේ ආරම්භයේ සිට නැගෙනහිර පළාත ද ඊට ඇතුලත් කර ඇත. මෙය 2003 වර්ෂයේ සටන් විරාමය තවදුරටත් පැවතීම හේතුවෙන් උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති සාමකාමී වාතාවරණය තුළින් ඇති වූ ප්‍රතිඵලයක් ලෙස හැඳින්විය හැකිය. ඒ අනුව 2002 හතරවන කාර්තුවේ සියයට 7.5 ක් වූ සේවා වියුක්ති අනුපාතිකය 2003 පළමු කාර්තුවේ සියයට 9.2 ක් ලෙස වාර්තා වූ අතර එයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ නැගෙනහිර පළාතේ සේවා වියුක්ති අනුපාතිකය මීට පෙර වසර වලදී සමීක්ෂණ මගින් ආවරණය වූ ප්‍රදේශවලට වඩා ඉහළ අගයක් ගත් බැවිනි. කෙසේ වෙතත් 2003 වර්ෂයේ ආර්ථික වර්ධනයට සමගාමීව කෘෂිකාර්මික, ඉදිකිරීම් සහ ප්‍රවාහන, ගබඩා කිරීම් හා සන්නිවේදන යන ක්ෂේත්‍ර තුළ රැකියා උත්පාදනයක් වර්ෂයේ අවසන් භාගයේ ඇතිවීම හේතුවෙන් වඩා පුළුල් භූගෝලීය ආවරණයක් සහිතව ද සේවා වියුක්ති අනුපාතිකයේ පහළ බැසීමක් දක්නට ලැබුණි. 2003 වර්ෂයේ දී විදේශ සේවා නියුක්තිය තවදුරටත් වැඩිවුවද 2002 වර්ෂය හා සසඳන කළ එය මන්දගාමී වැඩිවීමකි. ගෘහ සේවිකාවන් විදේශ රැකියා සඳහා පිටත්ව යාම අඩුවීම මෙම මන්දගාමීත්වයට හේතුවිය.

## 7.2 ජනගහනය

රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුවට අනුව 2003 වර්ෂය සඳහා ඇස්තමේන්තු කළ මධ්‍ය වාර්ෂික ජනගහනය සියයට 1.3 කින් වර්ධනය වූ අතර එය මිලියන 19.3 ක් විය. සටන් විරාමය තවදුරටත් පැවතීම නිසා උතුරු නැගෙනහිර පළාත් වල පැවති සාමකාමී වාතාවරණය හේතුවෙන් වසර

ගණනාවකට පසු තම මුල් වාසස්ථානවල නැවත පදිංචියට යැමට එම ප්‍රදේශවල විසූ ජනතාවට හැකි විය. මෙය දිස්ත්‍රික්කවල ජනගහන වෙනස්වීම් මගින් ප්‍රත්‍යක්ෂ වූ අතර, (සංඛ්‍යා සටහන 7.1) ඒ අනුව ජනගහනය මුලතිව්, කිලිනොච්චි, වව්නියා සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල සිට යාපනය, ත්‍රිකුණාමලය සහ මඩකලපුව යන දිස්ත්‍රික්ක තුළට සංක්‍රමණය වීම පැහැදිලිව දැකිය හැකිය.

ජනගහනය වයස්ගත වෙමින් පැවතීම තවදුමිටත් ශ්‍රී ලංකාවෙහි වැදගත් ප්‍රජා විද්‍යාත්මක සාධකයක් ලෙස පවතින අතර මෙය දිගු කාලීනව ආර්ථික සංවර්ධනය කෙරෙහි බලපානු ඇත. 2001 සංගනන ප්‍රතිඵල සහ 2003 වර්ෂයේ තාවකාලිකව ඇස්තමේන්තු කළ වයස් අනුව ජනගහන ව්‍යාප්තිය මගින් මෙය ප්‍රත්‍යක්ෂ වේ. වයස 0-14 වයස් කාණ්ඩයට අයත් ජනගහනය සියයට 1.2 කින් වර්ධනය වූ අතර එය සියයට 1.3 ක් වූ 2003 වර්ෂයේ මැදි වසර ජනගහන වර්ධන වේගයට වඩා පහළ අගයකි. සංසන්දනාත්මකව ගත්කල වයස 55 ට වැඩි වයස් කාණ්ඩයට අයත් ජනගහනය සියයට 1.4 කින් වර්ධනය විය.

## 7.3 ශ්‍රම බලකාය

ශ්‍රම බලකාය ලෙස වයස 10 ට වැඩි නිශ්චිත කාලසීමාවකදී රැකියාවක් කිරීමට හැකි සහ කැමති පුද්ගලයින් හැඳින්වෙන අතර, මෙය 2002 තුන්වන කාර්තුවේ දී මිලියන 7.05 සිට 2003 වර්ෂයේ තවදුරටත් වැඩි වී 2003 තුන්වන කාර්තුවේ දී මිලියන 7.61 ලෙස පැවතිනි. මෙම වැඩිවීම පුද්ගලයින් 559,000 ක් විය. මෙම කාල පරාසයට සමානුරූපීව 2001 සිට 2002 සඳහා වැඩිවීම පුද්ගලයින් 320,000 ක් විය. 2003 වර්ෂයේ ආරම්භයේ සිට නැගෙනහිර පලාත කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට ඇතුළත් කිරීම, ශ්‍රම බලකාය නියුණු ලෙස වැඩිවීම කෙරෙහි සෘජුවම බලපාන ලදී. මෙම වැඩිවීම මගින් 2001 වර්ෂයේ සිට ඇති වූ ආර්ථික ප්‍රවර්ධනය හේතුකොට ඇති වූ ධනාත්මක අපේක්ෂාවන් නිසා ආර්ථික ක්‍රියාවලියන්හි නිරතවීමට ඇති දැඩි කැමැත්ත යම්දුරකට පිළිබිඹු වේ. ශ්‍රම බලකායට සේවා නියුක්තිය හා සේවා වියුක්තිය අයත් වේ. සේවා නියුක්ති පුද්ගලයන් 564,000 ක වැඩිවීම සහ සේවා වියුක්තිය පුද්ගලයින් 5,000 කින් වැඩිවීම 2003 වර්ෂයේ ශ්‍රමබලකාය වැඩිවීම කෙරෙහි දායක විය.

ශ්‍රම බලකාය වැඩිවීමක් පෙන්නුම් කලද ශ්‍රම බලකා සහභාගීත්ව අනුපාතිකය (ශ්‍රම බලකාය වයස 10ට වැඩි ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස) 2002 තුන්වන කාර්තුවේ සියයට 49.4 සිට (නැගෙනහිර පලාත නැතිව) 2003 තුන්වන කාර්තුවේ දී නැගෙනහිර පලාතද අඩංගුව සියයට 48.6ක් දක්වා පහත වැටුනු අතර, මෙය නැගෙනහිර පලාත සඳහා ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය අඩු මට්ටමක පැවතීම හේතුවිය.

**7.1 සංඛ්‍යා සටහන**

**දිස්ත්‍රික්ක මට්ටමින් ජනගහනය**

පුද්ගලයින් දහස් ගණනින්

| දිස්ත්‍රික්කය | 2001 (අ) | 2002 | 2003 (ආ) | වෙනස | වෙනස % |
|---|---|---|---|---|---|
| කොළඹ | 2234 | 2266 | 2305 | 39 | 1.7 |
| ගම්පහ | 2066 | 2077 | 2089 | 12 | 0.6 |
| කළුතර | 1061 | 1069 | 1077 | 8 | 0.7 |
| ගාල්ල | 991 | 1000 | 1011 | 11 | 1.1 |
| මාතර | 761 | 770 | 780 | 10 | 1.3 |
| හම්බන්තොට | 525 | 529 | 533 | 4 | 0.8 |
| බදුල්ල | 775 | 787 | 801 | 14 | 1.8 |
| මොණරාගල | 396 | 401 | 405 | 4 | 1.0 |
| මහනුවර | 1273 | 1288 | 1307 | 19 | 1.5 |
| මාතලේ | 442 | 448 | 453 | 5 | 1.1 |
| නුවරඑළිය | 700 | 707 | 714 | 7 | 1.0 |
| කෑගල්ල | 780 | 784 | 789 | 5 | 0.6 |
| රත්නපුරය | 1008 | 1020 | 1036 | 16 | 1.6 |
| කුරුණෑගල | 1452 | 1461 | 1475 | 14 | 1.0 |
| පුත්තලම | 705 | 713 | 721 | 8 | 1.1 |
| අනුරාධපුරය | 747 | 754 | 764 | 10 | 1.3 |
| පොළොන්නරුව | 359 | 363 | 368 | 5 | 1.4 |
| අම්පාර | 589 | 596 | 605 | 9 | 1.5 |
| මඩකලපුව | 486 | 522(ඇ) | 536 | 14 | 2.7 |
| ත්‍රිකුණාමලය | 340 | 358(ඇ) | 377 | 19 | 5.3 |
| යාපනය | 491 | 532(ඇ) | 589 | 57 | 10.7 |
| කිලිනොච්චිය | 127 | 154(ඇ) | 140 | -14 | -9.1 |
| මන්නාරම | 152 | 98(ඇ) | 97 | -1 | -1.0 |
| මුලතිව් | 122 | 164(ඇ) | 141 | -23 | -14.0 |
| වව්නියාව | 150 | 146(ඇ) | 139 | -7 | -4.8 |
| එකතුව | 18,732 | 19,007 | 19,252 | 245 | 1.3 |

මූලය : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

(අ) 2001 ජන හා නිවාස සංගණනය පදනම් කොටගෙන සකස් කර ඇත.
(ආ) තාවකාලික දත්ත
(ඇ) 2002 වසර සඳහා මෙම දිස්ත්‍රික්කවලට අදල ජනගහන දත්ත රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් අදල දිස්ත්‍රික්කකවල දිසාපතිවරුන්ගෙන් ලබාගෙන ඇත. අනිකුත් දිස්ත්‍රික්ක සඳහා ජනගහන ඇස්තමේන්තු 2001 ජනගහන සංගණන දත්තයන්, 2002 ස්වාභාවික ජනගහන වැඩිවීම සහ ශුද්ධ සංක්‍රමණ දත්තයන් උපයෝගී කොටගෙන පුරෝකථනය කර ගණනය කොට ඇත.

2003 තුන්වන කාර්තුව සඳහා නැගෙනහිර පළාත නොමැතිව ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය සියයට 49.4ක් විය. තවද ස්ත්‍රී සහ පුරුෂ ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකවල පහත වැටීමක් දක්නට ලැබුණි. එසේ නමුත්, ස්ත්‍රී සහභාගිත්ව අනුපාතිකය 2002 තුන්වන කාර්තුවේ දී සියයට 32 ක සිට 2003 තුන්වන කාර්තුවේ දී සියයට 30.8 දක්වා පහත වැටුනු අතර, සංසන්දනාත්මකව පුරුෂ සහභාගිත්ව අනුපාතිකය එම කාල පරිච්ඡේදයට අනුරූපව සියයට 67.8 සිට සියයට 67.1 දක්වා පහත වැටුනි.

**7.2 සංඛ්‍යා සටහන**

**ප්‍රධාන වයස් කාණ්ඩ අනුව ජනගහනය**

| දිස්ත්‍රික්කය | 2002 (අ) | 2003 (අ) | % වෙනස |
|---|---|---|---|
| ජනගහන | 19,007 | 19,252 | 1.3 |
| 0-14 අවුරුදු | 5,062 | 5125 | 1.2 |
| 15-54 අවුරුදු | 11,410 | 11556 | 1.3 |
| 55 සහ ඉහළ | 2,535 | 2571 | 1.4 |

මූලය : රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

(අ) තාවකාලික දත්ත

**7.3 සංඛ්‍යා සටහන**
**ශ්‍රම බලකා සහභාගිත්වය**

| වර්ෂය | කුටුම්බ ජනගහනය(අ) පුද්ගලයන් '000 | ශ්‍රම බලකාය පුද්ගලයන් '000 | සේවා නියුක්ත පුද්ගලයන් '000 | සේවා වියුක්ත පුද්ගලයන් '000 | ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතිකය % (ආ) | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | පුරුෂ | ස්ත්‍රී | එකතුව |
| 1994 | 12,493 | 6,079 | 5,281 | 798 | 65.4 | 32.0 | 48.7 |
| 1995 | 12,736 | 6,106 | 5,357 | 749 | 64.4 | 31.7 | 47.9 |
| 1996 | 12,831 | 6,242 | 5,537 | 705 | 65.9 | 31.6 | 48.6 |
| 1997 | 12,871 | 6,266 | 5,608 | 658 | 65.7 | 32.0 | 48.7 |
| 1998 | 12,882 | 6,660 | 6,049 | 611 | 67.3 | 36.4 | 51.7 |
| 1999 | 13,169 | 6,673 | 6,082 | 591 | 67.7 | 34.1 | 50.7 |
| 2000 | 13,572 | 6,827 | 6,310 | 517 | 67.2 | 33.9 | 50.3 |
| 2001 | 13,870 | 6,773 | 6,236 | 537 | 66.2 | 31.9 | 48.8 |
| 2002 | 14,201 | 7,145 | 6,519 | 626 | 67.9 | 33.6 | 50.3 |
| පළමු කාර්තුව | 14,103 | 7,296 | 6,663 | 633 | 67.9 | 35.9 | 51.7 |
| දෙවන කාර්තුව | 14,164 | 7,017 | 6,330 | 688 | 67.2 | 32.5 | 49.5 |
| තෙවන කාර්තුව | 14,267 | 7,050 | 6,409 | 641 | 67.8 | 32.0 | 49.4 |
| සිව්වන කාර්තුව | 14,272 | 7,219 | 6,677 | 542 | 68.5 | 33.9 | 50.6 |
| 2003 (ඇ) (ඈ) | 15,604 | 7,593 | 6,945 | 648 | 66.9 | 31.2 | 48.7 |
| පළමු කාර්තුව | 15,566 | 7,643 | 6,943 | 700 | 66.8 | 32.2 | 49.1 |
| දෙවන කාර්තුව | 15,573 | 7,527 | 6,920 | 607 | 66.8 | 30.6 | 48.3 |
| තෙවන කාර්තුව | 15,672 | 7,609 | 6,973 | 636 | 67.1 | 30.8 | 48.6 |

(අ) වයස අවු.10 සහ ඊට වැඩි කුටුම්බ ජනගහනය
(ආ) ශ්‍රම බලකාය කුටුම්බ ජනගහනයේ ප්‍රතිශතයක් ලෙස
(ඇ) කාර්තු තුනෙහි සාමාන්‍යය
(ඈ) 2002 සිව්වැනි කාර්තු දක්වා උතුරු හා නැගෙනහිර පලාත්වල දත්ත ශ්‍රම බලකා සමීක්ෂණයට ඇතුළත්කර නොමැත. 2003 පළමු කාර්තුවේ සිට නැගෙනහිර පලාතෙහි දත්ත ඇතුළත් කර ඇති අතර, උතුරු පලාත තවදුරටත් සමීක්ෂණය සඳහා ඇතුළත් කර නොමැත.

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

## 7.4 සේවා නියුක්තිය

කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව යම් පුද්ගලයකු පැයක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් ගෙවීමකට, යම් ලාභයක් ඉපැයීම සඳහා හෝ ගෙවීමක් නොලබා, පවුලේ වැඩ කටයුත්තකට සමීක්ෂණය සිදුකරන දවසේ සිට සතියකට ප්‍රථම කාල පරිච්ඡේදය තුළ යෙදෙයි නම් එම පුද්ගලයා සේවා නියුක්තියකු ලෙස හැඳින්වේ. අසනීපයෙන් පසු වූ නිසා, අයහපත් කාලගුණය නිසා හෝ කාර්මික ආරවුල් නිසා තාවකාලිකව සේවයට වාර්තා නොකළ ද එම පුද්ගලයින්

**7.4 සංඛ්‍යා සටහන**
**සේවා නියුක්ති මූලයන්**

(ප්‍රතිශතය)

| වර්ෂය | රාජ්‍ය අංශයේ සේවකයින් | පෞද්ගලික අංශයේ සේවකයින් | සේව්‍යයන් | ස්වයං රැකියාවන්හි නියුතු වූවන් | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1991 | 22.9 | 39.5 | 2.2 | 25.4 | 10.0 | 100 |
| 1992 | 20.0 | 40.0 | 1.6 | 27.1 | 11.2 | 100 |
| 1993 | 17.4 | 42.8 | 2.0 | 27.4 | 10.4 | 100 |
| 1994 | 16.4 | 44.3 | 2.3 | 27.2 | 9.8 | 100 |
| 1995 | 15.6 | 44.3 | 2.5 | 28.3 | 9.4 | 100 |
| 1996 | 15.0 | 45.8 | 2.3 | 26.8 | 10.0 | 100 |
| 1997 | 15.1 | 44.3 | 2.3 | 28.8 | 9.4 | 100 |
| 1998 | 14.5 | 41.2 | 1.9 | 28.9 | 13.6 | 100 |
| 1999 | 14.4 | 43.1 | 2.0 | 28.3 | 12.2 | 100 |
| 2000 | 13.4 | 42.9 | 2.3 | 28.4 | 13.0 | 100 |
| 2001 | 13.8 | 44.8 | 2.3 | 28.5 | 10.6 | 100 |
| 2002 | 13.4 | 44.5 | 2.8 | 28.6 | 10.7 | 100 |
| පළමු කාර්තුව | 12.7 | 45.2 | 3.1 | 26.9 | 12.1 | 100 |
| දෙවන කාර්තුව | 13.4 | 44.5 | 3.1 | 28.6 | 10.4 | 100 |
| තෙවන කාර්තුව | 13.4 | 45.7 | 2.4 | 28.6 | 10.0 | 100 |
| සිව්වන කාර්තුව | 14.2 | 42.6 | 2.5 | 30.3 | 10.4 | 100 |
| 2003 (අ) (ආ) | 13.6 | 43.9 | 2.7 | 29.7 | 10.1 | 100 |
| පළමු කාර්තුව | 14.2 | 44.0 | 2.7 | 29.6 | 9.5 | 100 |
| දෙවන කාර්තුව | 13.3 | 43.6 | 2.7 | 30.4 | 10.0 | 100 |
| තෙවන කාර්තුව | 13.2 | 44.1 | 2.6 | 29.2 | 10.8 | 100 |

(අ) කාර්තු තුනෙහි සාමාන්‍යය
(ආ) 2002 සිව්වැනි කාර්තුව දක්වා උතුර හා නැගෙනහිර පලාත්වල දත්ත ශ්‍රම බලකා සමීක්ෂණයට ඇතුළත් කර නොමැත. 2003 පළමු කාර්තුවේ සිට නැගෙනහිර පලාතෙහි දත්ත ඇතුළත් කර ඇති අතර, උතුරු පලාත තවදුරටත් සමීක්ෂණය සඳහා ඇතුළත් කර නොමැත.

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

**7.5 සංඛ්‍යා සටහන**

**රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය**

| වර්ෂය | රාජ්‍ය ආයතන (අ) | අර්ධ රාජ්‍ය ආයතන (ආ) | එකතුව |
|---|---|---|---|
| 1990 | 649,000 | 703,200 | 1,352,200 |
| 1994 | 699,898 | 625,266 | 1,325,164 |
| 1995 | 737,504 | 569,484 | 1,306,988 |
| 1996 | 752,194 | 409,278 | 1,161,472 |
| 1997 | 762,067 | 309,633 | 1,071,700 |
| 1998 | 790,492 | 300,654 | 1,091,146 |
| 1999 | 822,122 | 298,248 | 1,120,370 |
| 2000 | 856,665 | 299,615 | 1,156,280 |
| 2001 | 863,993 | 300,997 | 1,164,990 |
| 2002 (ඇ) | 790,108 | 271,291 | 1,061,399 |
| 2003 (ඈ) | 785,756 | 257,452 | 1,043,208 |

මූලය : ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) මධ්‍යම රජය, පළාත් සභා සහ ප්‍රාදේශීය සභා

(ආ) රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරීන්

(ඇ) ජන ලේඛණය හා සංඛ්‍යා ලේඛණ දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලැබූ රාජ්‍ය හා අර්ධ රාජ්‍ය සේවක සංගනණය - 2002 සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වනු ලැබූ රාජ්‍ය හා රාජ්‍ය සේවක සමීක්ෂණය මත පදනම් වූ නව දත්ත ශ්‍රේණියකි.

(ඈ) තාවකාලික දත්ත.

සේවා නියුක්ත ලෙස සැලකේ. කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, 2002 දෙවන කාර්තුවේ සිට වැඩිවන ප්‍රවණතාවය වෙනස් කරමින් සේවා නියුක්ති අනුපාතිකය 2002 තුන්වන කාර්තුවේ සියයට 92.5 සිට 2003 පළමු කාර්තුවේ සියයට 90.8 දක්වා අඩුවුවද, 2003 තුන්වන කාර්තුව සිට සියයට 91.6 දක්වා වැඩි විය. 2002 හතර වන කාර්තුව හා සසඳන විට 2003 පළමු කාර්තුවේ අඩුවීම සඳහා නැගෙනහිර පලාත කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට ඇතුල් කිරීම ආංශිකව බලපාන ලදී. නැගෙනහිර පලාත අත්හළ විට, 2003 පළමු කාර්තුව සඳහා සේවා නියුක්ති අනුපාතිකය සියයට 91.7 ලෙස පැවතිනි.

සමස්ථ සේවා නියුක්ති අංශ පහ තුළ ප්‍රතිශත දායකත්වයෙහි විශේෂ වෙනස්වීමක් දක්නට නොලැබුණි. රාජ්‍ය අංශයේ සේවා නියුක්තකයින්ගේ ප්‍රතිශත දායකත්වය ආන්තික ලෙස අඩුවීමක් දක්නට ලැබුණු අතර, මෙමගින් අත්‍යවශ්‍ය සේවක අවශ්‍යතාවන් සඳහා රාජ්‍ය අංශයට සේවකයන් බඳවා ගැනීමේ ප්‍රතිපත්තිය ක්‍රියාත්මකවීම පිළිබිඹු වේ. පෞද්ගලික අංශයේ සේවා නියුක්තකයින්ගේ ප්‍රතිශත දායකත්වය සියයට 45.7 සිට සියයට 44.1 දක්වා පහත වැටුණි. ස්වයං රැකියාවන්හි නියුක්ත පුද්ගලයින්ගේ හා ගෙවීමක් නොලබා සේවයේ යෙදෙන පුද්ගලයින්ගේ ප්‍රතිශත දායකත්වය, සේව්‍යයන්ගේ ප්‍රතිශත දායකත්වය මෙන්ම ඉහළ ගියද එය ආන්තික වැඩිවීමකි.

ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය අංශයේ සේවා නියුක්ති සමීක්ෂණය මගින් රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි පහත වැටීම පෙන්නුම් කරනු ලබයි. එම සමීක්ෂණයේ ඇස්තමේන්තු

**7.6 සංඛ්‍යා සටහන**

**ආර්ථික ක්‍රියාකාරිත්වය අනුව සේවා නියුක්තිය**

| අංශය | පුද්ගලයින් දහස් | | | | | | | | | මුළු සේවා නියුක්තියේ ප්‍රතිශතය | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2000 (අ) | 2001 (ආ) | 2002 | | | | 2003(ඇ) | | | 2002 | 2003 |
| | | | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 4 වන කාර්තුව | 1 වන කාර්තුව | 2 වන කාර්තුව | 3 වන කාර්තුව | 3 වන කාර්තුව | 3 වන කාර්තුව |
| **කෘෂිකර්මය** | **2,274** | **2,033** | **2,342** | **2,152** | **2,120** | **2,376** | **2,381** | **2,415** | **2,439** | **33.1** | **35.0** |
| **කර්මාන්ත** | **1,491** | **1,491** | **1,422** | **1,313** | **1,355** | **1,351** | **1,503** | **1,457** | **1,513** | **21.1** | **21.7** |
| පතල් හා කැනීම් (ඈ) | 67 | 110 | | | | | | | | | |
| නිමැවුම් කර්මාන්ත | 1,045 | 1,057 | 1,125 | 1,035 | 1,092 | 1,042 | 1,106 | 1,125 | 1,120 | 17.0 | 16.1 |
| ඉදිකිරීම් | 348 | 324 | 297 | 278 | 263 | 309 | 397 | 332 | 393 | 4.1 | 5.6 |
| විදුලිය, ගෑස් සහ ජලය (ඉ) | 31 | | | | | | | | | | |
| **සේවා** | **2,545** | **2,711** | **2,898** | **2,865** | **2,934** | **2,950** | **3,059** | **3,049** | **3,021** | **45.8** | **43.3** |
| වෙළඳාම සහ ආපනශාලා ආදිය | 801 | 811 | 973 | 928 | 1,012 | 912 | 988 | 957 | 958 | 15.8 | 13.7 |
| ප්‍රවාහන, ගබඩා කිරීම සහ සන්නිවේදනය | 307 | 389 | 282 | 334 | 297 | 324 | 376 | 332 | 358 | 4.6 | 5.1 |
| මූල්‍ය, රක්ෂණ සහ නිශ්චල දේපල | 131 | 141 | 153 | 155 | 189 | 179 | 217 | 195 | 177 | 2.9 | 2.5 |
| පෞද්ගලික සේවා සහ අදාළ වෙනත් සේවා | 1,307 | 1,371 | 1,490 | 1,448 | 1,436 | 1,535 | 1,478 | 1,565 | 1,528 | 22.4 | 21.9 |
| මුළු සේවා නියුක්තිය | 6,310 | 6,236 | 6,662 | 6,330 | 6,409 | 6,677 | 6,943 | 6,921 | 6,973 | 100.0 | 100.0 |
| ශ්‍රම බලකායේ ප්‍රතිශතය | 92.4 | 92.1 | 91.3 | 90.2 | 90.9 | 92.5 | 90.8 | 91.9 | 91.6 | | |

මූලය : ජනලේඛන සහ සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) කාර්තු හතරේ සාමාන්‍යය

(ආ) කාර්තු තුනක සාමාන්‍ය, 2001 දෙවැනි කාර්තුව සඳහා ශ්‍රම බලකා සමීක්ෂණය ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වා නොමැත.

(ඇ) 2002 සිව්වන කාර්තුව දක්වා උතුර හා නැගෙනහිර පලාත්වල දත්ත ශ්‍රම බලකා සමීක්ෂණයට ඇතුළත්කර නොමැත.
2003 පළමු කාර්තුවේ සිට නැගෙනහිර පලාතෙහි දත්ත ඇතුළත් කර ඇති අතර, උතුරු පලාත තවදුරටත් සමීක්ෂණය සඳහා ඇතුළත්කර නොමැත.

(ඈ) 2002 පළමු කාර්තුවේ සිට පතල් හා කැනීම් උප අංශ පෞද්ගලික සේවා හා වෙනත් සේවා යටතේ වර්ගීකරණය කර ඇත.

(ඉ) 2001 පළමු කාර්තුවේ සිට ශ්‍රම බලකා සමීක්ෂණයේදී විදුලිය, ගෑස් හා ජලය උප අංශය පෞද්ගලික සේවා සහ වෙනත් සේවා යටතේ වර්ගීකරණය කර ඇත.

විශේෂ සටහන 13

## රැකියා වෙළෙඳපොළ එක් පියසකට : ශ්‍රී ලංකාවේ රැකියා පියස

### හැඳින්වීම

රැකියා අපේක්ෂකයින් සේවා යෝජකයින් විසින් ඉල්ලුම් කරනු ලබන සුදුසුකම්, නිපුනතා හා අත්දැකීම් සහ ඔවුන්ගේ රැකියාව පිළිබඳ විස්තර හා ලැබෙන වේතනය සම්බන්ධව සම්පූර්ණ තොරතුරු දැන ගැනීමට අවශ්‍ය වේ. එසේම සේවා යෝජකයින් ඔවුන්ගේ ආයතනවල රැකියා පුරප්පාඩු පිරවීම සඳහා පැවතිය යුතු සුදුසුකම්, නිපුනතා සහ අත්දැකීම් මනාලෙස සපුරාලන පිරිස් සොයා ගැනීමට කැමැත්තක් දක්වයි. ප්‍රායෝගිකව පරිපූර්ණ තොරතුරු සහිත එවැනි ශ්‍රම වෙළෙඳපොළ තත්ත්වයක් පැවතිය නොහැකි තරම් වේ. ශ්‍රී ලංකාවේ ශ්‍රම වෙළෙඳපොළෙහි ඉල්ලුම හා සැපයුම අතර නොගැලපීමට රැකියා අපේක්ෂකයින්ගේ අධ්‍යාපන සුදුසුකම් හා නිපුණතා හා සංස්කෘතිකමය බැඳීම් හේතුවෙන් රැකියා අවස්ථා භාර ගැනීමට ඇති මැලිකම නිසා සැපයුම නිරෝධනය වීම බලපාන අතර, එමෙන්ම රැකියා අපේක්ෂකයින් හා රැකියා සැපයීමට ශක්තියක් ඇති අයට අවශ්‍ය තොරතුරු මඳකම ද එම නොගැලපීමට බලපායි.

1 රූප සටහන
ඉල්ලුම සහ සැපයුමෙහි උපනති විශ්ලේෂණය




මෙම ප්‍රශ්නවලට විසඳුමක් වශයෙන් රැකියා පියස සංකල්පය පියවර 7: ජාතික රැකියා මූලාශ්‍ර හා සැපයීමේ වැඩපිළිවෙල, රැකියා හා කම්කරු අමාත්‍යංශය විසින් සම්පාදනය කරන ලද ජාතික රැකියා ප්‍රතිපත්තිය - 2002 හි අන්තර්ගත කරන ලදී. ජාතික රැකියා ප්‍රතිපත්තිය මගින් රැකියා පියස ස්වාධීන, මධ්‍යස්ථ හා දේශපාලනීකරණයෙන් තොර වැඩපිළිවෙලක් විය යුතු බව දැඩි ලෙස නිර්දේශ කර තිබේ. එමගින් දක්ෂතාවයට පමණක් සලකා විනිවිද පෙනෙන භාවය මූලික ප්‍රතිපත්තිය වනු ඇත. රැකියා පියස ව්‍යාපෘතිය රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සහභාගිත්වයෙන් ආරම්භ කරන ලදී. රැකියා හා කම්කරු අමාත්‍යංශය, පෞද්ගලික අංශය නියෝජනය කරමින් ලංකා වාණිජ මණ්ඩලය ද සමඟ අත්වැල් බැඳගත් අතර, රැකියා පියසෙහි කලමණාකාරිත්වය ලංකා වාණිජ මණ්ඩලයට පවරන ලදී. රැකියා පියස අන්තර් ජාලය හරහා හා සේවා මධ්‍යස්ථාන මත පදනම් වූ රැකියා සැපයුම් ජාලයක් වන අතර මෙමගින් රැකියා අපේක්ෂකයින් හා රැකියා සැපයීමට ශක්තියක් ඇති අය අතර හොඳ බැඳීමක් සඳහා අවශ්‍ය අතුරු මුහුණතක් සපයයි. රැකියා පියස මගින් තමන්ගේම ව්‍යාපාරයක් පටන් ගැනීමට බලාපොරොත්තු වන ව්‍යවසායකයන්ට උදව් දීම ද කෙරෙනු ඇත. රැකියා අපේක්ෂකයින් හා ස්වයං රැකියාවල නිරතවන්නන් අන්තර් ජාලය හරහා හෝ රැකියා පියස සේවා මධ්‍යස්ථානයකට පැමිණීමෙන් හෝ ලියාපදිංචි විය හැක. එලෙසම රැකියා සැපයීමට ශක්තියක් ඇති අයටද තම සේවා ස්ථානයෙහි ඇති රැකියා පුරප්පාඩු රැකියා පියසෙහි ප්‍රචාරය කරවාගත හැක. ලියාපදිංචි රැකියා අපේක්ෂකයින් රැකියා පියස පරිගණක දත්ත ගබඩාවෙහි ඇති දේශීය සහ විදේශීය රැකියා ඇබෑර්තු සමඟ ගලපනු ලැබේ. මෙලෙස ගැලපීමක් සිදු වූ විට එම තොරතුරු අදාල රැකියා සපයන්නන්ට දන්වනු ලැබේ. නිපුණතා හා වෘත්තිමය පුහුණු හා නැවත පුහුණුව සපයන ආයතන සමඟ සම්බන්ධකම් ඇතිකර ගැනීම සහ උපදේශක සේවා සැපයීම රැකියා පියස මගින් ඉටු කෙරෙන වැදගත් ක්‍රියා ලෙස සැලකේ. ලියාපදිංචි රැකියා අපේක්ෂකයින් මාස 3 ක් ඇතුලත රැකියා ඇබෑර්තුවක් සමඟ ගැලපීමට නොහැකි වුවහොත්, එම ඉල්ලුම් පත්‍රය සෝදිසියට භාජනය කර අවශ්‍ය නම් උපදේශක සේවාවකට යොමු කරන අතර, ඉන් පසුව අවශ්‍ය පුහුණු වැඩසටහන් සඳහා යොමු කරනු ලැබේ. ඊට අමතරව ස්වයං රැකියා සඳහා යොමු වූ ඉල්ලුම් කරුවන් අවශ්‍ය පුහුණු කටයුතු සඳහා ද යොමු කරනු ලැබේ.

### මෙතෙක් ලැබූ ප්‍රගතිය

නෝර්වේජියානු සංවර්ධන සහයෝගීතා ආයතනය රුපියල් මිලියන 40 ක්, රැකියා පියස ව්‍යාපෘතියේ ප්‍රථම අදියර ඉලක්ක ඉටු කරගැනීම සඳහා ප්‍රදානය කරන ලදී. රැකියා පියස ප්‍රථම සේවා මධ්‍යස්ථානය 2003 ජනවාරි මාසයේදී අගලවත්තේදී අරඹන ලද අතර, ඉන්පසු තවත් මධ්‍යස්ථාන 16 ක් 2003 මාර්තු මැද සිට මැයි දක්වා කාලය තුළ විවෘත කරන ලදී. රටේ නොයෙක් ප්‍රදේශවල පිහිටි සේවා මධ්‍යස්ථාන නවීන තොරතුරු සන්නිවේදන පද්ධතියක් මත ක්‍රියා කරන ජාලයක් මගින් කොළඹ පිහිටි ප්‍රධාන සේවා මධ්‍යස්ථානයට සම්බන්ධ කර ඇත. සංඛ්‍යා සටහන අංක 1 ට අනුව රැකියා පියස ආරම්භයේ සිට මේ දක්වා ඉතා සීඝ්‍ර වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

රැකියා පියසෙහි ලියාපදිංචි රැකියා අපේක්ෂකයින් රැකියා ලබාගැනීමේ හැකියාව වැඩිකිරීමට අවශ්‍ය පුහුණු වීම්

**1 සංඛ්‍යා සටහන**
**සැලසුම්ගත ඉලක්ක සහ සපුරාගැනීම්**

| ශීර්ෂය | පළමු වසර සඳහා ඉලක්ක | මුල් මාස 5 තුළ | 2004 ජනවාරි අවසානයට |
|---|---|---|---|
| මධ්‍යස්ථාන ගණන | 11 | 17 | 17 |
| රැකියා පියසෙහි ලියාපදිංචි මුළු රැකියා අපේක්ෂකයින් ගණන | 30,000 | 65,017 | 69,944 |
| රැකියා සපයන්නන්ගෙන් රැකියා පියසෙහි වාර්තාවූ ඇබෑර්තු ගණන | ඉලක්ක නැත | 19,946 | 30,003 |
| රැකියා පියස මගින් රැකියා ඇබෑර්තු සඳහා යොමුකළ ගණන | 2,000 | 11,046 | 16,368 |
| රැකියා පියස හරහා රැකියාලද රැකියා අපේක්ෂකයින් ගණන | 200 | 596 | 750 |

මූලය: රැකියා පියස – ශ්‍රී ලංකාව

පිළිබඳ තොරතුරු එක් රැස්කොට පැවති බැවින් නිපුනතා පුහුණුව හා නැවත පුහුණු කිරීමේ ආයතන සමඟ සම්බන්ධකම් ඇති කර ගැනීම, 2003 මැයි මස ආරම්භයේ සිට සාර්ථකව සිදු කරනු ලැබීය. මෙහිදී ලෝක බැංකු ගෝලීය සංවර්ධන පුහුණු ජාලයට සම්බන්ධ දුරස්ථ පුහුණු මධ්‍යස්ථානය සමඟ රැකියා පියස සම්බන්ධ වීම පුහුණු අවශ්‍යතා සපුරා ගැනීමට ඇතිකළ ප්‍රධාන ව්‍යාපෘතියක් ලෙස සැලකිය හැක. මෙමගින් ලියාපදිංචි රැකියා අපේක්ෂකයින් හට පරිගණක පුහුණුව ලබාදීමට බලාපොරොත්තු වන අතර මීට හේතුව සියයට 70 ක් පමණ රැකියා අපේක්ෂිකයින්ගේ ඉංග්‍රීසි හා පරිගණක දැනුම වැඩි දියුණු කළ යුතුවීමය.

තවද රැකියා පියස, තාක්ෂණ අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව සමඟ අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලද අතර එමගින් ද්විතීය අධ්‍යාපනය පමණක් ඇති නමුදු තාක්ෂණ හෝ ව්‍යවසායක පුහුණුවක් නැති ලියාපදිංචි රැකියා අපේක්ෂකයින් පුහුණු කිරීමේ කටයුතු එම දෙපාර්තමේන්තුව හට පවරනු ලැබීය. එකී කාණ්ඩය මුලු ලියාපදිංචි රැකියා අපේක්ෂකයින්ගෙන් ඉහළ ප්‍රතිශතයක් බැවින් (රූප සටහන 2) තාක්ෂණ අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව සමඟ ඇතිකළ අවබෝධතා ගිවිසුම මගින් සැලකිය යුතු ප්‍රතිශතයකට රැකියා ලබා ගත හැකි මට්ටමකට පත්වීමට ඉඩලැබේ. එපමණක් නොව තාක්ෂණ අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුව සමග ඇතිකර ගත් අවබෝධතා ගිවිසුම මගින් දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන කාර්මික විද්‍යාල 37 හි ලියාපදිංචි ශිෂ්‍යයන් හට රැකියා පියසේ ලියා පදිංචිවීමට හැකියාව ලැබෙන අතර එමගින් ඔවුන්ට පුහුණු කටයුතු අවසානයේ දී රැකියා සඳහා ඉදිරිපත් විය හැකිවේ. එමෙන්ම රැකියා පියස මගින් රැකියා අපේක්ෂකයින්ගේ වෙනස්වන අවශ්‍යතා සම්බන්ධ තොරතුරු නිරන්තරයෙන් තාක්ෂණ අධ්‍යාපන හා පුහුණු දෙපාර්තමේන්තුවට ලැබීමට සැලැස්වීම ඉතා ප්‍රයෝජනවත්වේ. ඒ අතර, පෞද්ගලික අංශයේ උදව් ඇතිව රැකියා පියස මගින් වෘත්තිය මඟ පෙන්වීම් වැඩ සටහන් සංවිධානය කරන ලදී. ලියා පදිංචි රැකියා අපේක්ෂකයින්ගේ පුහුණු කටයුතු සඳහා මූලික ප්‍රතිපාදන මගින් මුදල් වෙන්කොට නොතිබුණද අවශ්‍ය පුහුණු කටයුතු සඳහා යොමු කිරීමට හැකි උපරිම උත්සාහයක් රැකියා පියස විසින් ගන්නා ලදී.

ස්වයං රැකියාවලට යොමු වූවන්ට පුහුණුව සම්බන්ධයෙන් සහයෝගය දීම රැකියා පියස ව්‍යාපෘතියේ තවත් මූලික කාර්යයක් ලෙස සැලකේ. මෑතකදී "තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කොට දියුණු කරගන්න" යන සංකල්පය යටතේ පළමු මධ්‍යස්ථානය මහනුවර රැකියා පියස තුළ ආරම්භ විය. ස්වීඩන අන්තර්ජාතික සංවර්ධන ඒජන්සිය මගින් ක්‍රියාකාරකම් මත පදනම් වූ මුදල් ආධාර, රැකියා පියස ව්‍යාපෘතියේ දෙවන වසර සිට ප්‍රදානය කිරීම මගින් රැකියා අපේක්ෂකයින් හා ස්වයං රැකියා සඳහා යොමුවන්නන් හට පුහුණුව ලබාදීම සඳහා විශේෂ සැලකිල්ලක් ගෙන කටයුතු කිරීමට රැකියා පියස බලාපොරොත්තු වේ.

ශ්‍රී ලංකාව තුළ රැකියා පියස ක්‍රියාත්මක කිරීමේ මූලික අධ්‍යයන අදියරේ දී ඔස්ට්‍රේලියාව හා ස්වීඩනය යන රටවල රැකියා පියස ව්‍යාපෘති වල කාර්යයන් සැලකිල්ලට ගන්නා ලදී. ඉන්දියාව හා මැලේසියාව වැනි ආසියානු රටවල්වලද රැකියා පියස සංකල්පය භාවිතා කෙරේ. ඉන්දුනීසියාව මෑතකදී රැකියා පියස සංකල්පය යටතේ රැකී රක්ෂා ව්‍යාපෘතියක් ආරම්භ කරන ලද අතර ශ්‍රී ලංකාවේ රැකියා පියස ව්‍යාපෘතිය අන්තර්ජාලය තුළින් සේවා සැපයීමේ වැඩ සටහන අධ්‍යයනය කිරීම සඳහා ත්‍රිකුණාමලය රැකියා පියස මධ්‍යස්ථානය තෝරා ගන්නා ලදී.

**2 රූප සටහන**
**ලියාපදිංචි රැකියා අපේක්ෂකයින්ගේ අධ්‍යාපන සුදුසුකම්වල ව්‍යාප්තිය 30.11.03 දක්වා**




මූලය රැකියා පියස - ශ්‍රී ලංකාව

සංවර්ධිත රටවල දී රැකියා පියසක කාර්යභාරය වඩාත් කාර්යක්ෂමව කිරීම සඳහා අත්‍යාවශ්‍ය අංගයක් ලෙස පරිගණක ගත රැකියා තොරතුරු ජාලයක් **(o-net)** යොදාගනු ලබන අතර, එය ශ්‍රී ලංකාව තුළ මෙතෙක් ස්ථාපිත කොට නොමැත. **o-net** පරිගණකගත දත්ත ගබඩාවක් වන අතර, මෙහි එම රටවල බොහෝ රැකියා සම්බන්ධයෙන් මූලික නිපුණතා, හැකියාවන්, බලාපොරොත්තුවන දැනුම සහ අතිකුත් ගුණාංග අඩංගු වේ. මෙම පරිගණක ගත දත්ත ගබඩාව අන්තර් ජාලය තුළින් භාවිතයට ගැනීම මගින් රැකියා අපේක්ෂකයින් කුඩා ව්‍යාපාරිකයින් සහ මානව සම්පත් වෘත්තිකයන් හට රැකියා සඳහා නියමිත නිපුණතා, අදාළ රැකියාවන් හා රැකියා සම්බන්ධ සංක්ෂිප්ත වාර්තා ලබාගත හැකිය. ශ්‍රී ලංකාවේ රැකියා පියස හට **o-net** සේවාව සැපයීමට තවම හැකියාවක් නැත. **o-net** හි සාර්ථකත්වය රැකියා සමීක්ෂණ මත රඳා පවතින අතර අධික වියදම් දැරිය යුතු කාර්යයකි. මෙම සමීක්ෂණ මගින් අනාගත රැකියා අපේක්ෂකයින්හට ඔවුන්ගේ අභිමතාර්ථය අනුව ඵලදායි වෘත්තිමය කටයුත්තක් ආරම්භ කිරීමට හැකිවනු පමණක් නොව, එමගින් අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකවරුන්ට හා අදාල බලධාරීන්ට තොරතුරු සපයනු ලබන අතර, මෙය රටෙහි රැකියා ඉල්ලුමට සරිලන විෂය මාලාවක් සකස් කිරීමට භාවිතා කළ හැක.

**නිගමන**

රැකියා පියස ව්‍යාපෘතිය මේ වන විට මාස 10ක් පුරා ක්‍රියාත්මක වී ඇත. කෙසේ වුවද ලියාපදිංචි මුළු රැකියා අපේක්ෂකයින් හා දත්ත ගබඩාවේ රැකියා ඇබෑර්තු අතර හා රැකියා සඳහා යොමු කළ රැකියා අපේක්ෂකයින් හා රැකියා ලැබුනු ප්‍රමාණය අතර සැලකිය යුතු වෙනස්කම් පවතී. රැකියා පියස ආධාරයෙන් රැකියා ලබාගත් අය නැවත දැනුම් දීම මඳ බව රැකියා ලැබුණු ප්‍රමාණය අව ප්‍රමාණවීමට හේතුවේ. එසේ වුවත් මෙය අඩු අගයකි. එක් රැකියා අවස්ථාවක් සඳහා වැය කෙරෙන පිරිවැය තුළින් රැකියා පියස සාර්ථක නැතිබව යමෙකුට තර්ක කල හැක. එනමුදු රැකියා පියස, රැකියා සඳහා යොමු කරන වැඩ පිළිවෙලක් වන අතර එහි මූලික වගකීම වනුයේ ලියාපදිංචි රැකියා අපේක්ෂකයින් රැකියා සඳහා යොමු කිරීමයි. 2004 ජනවාරි මාසය අවසානයේදී රැකියා පියස මුළු ලියාපදිංචි රැකියා අපේක්ෂකයන්ගෙන් සියයට 23 ක් පවතින රැකියා ඇබෑර්තු සඳහා යොමු කොට ඇත.

රැකියා පියස වැනි ව්‍යාපෘතියක මූලික පිරිවැය අත්‍යාවශ්‍යයෙන්ම ඉහළ අගයකි. රැකියා පියස නඩත්තු කරගෙන යැමට අවශ්‍ය පිරිවැය කාලය සමඟ අඩු විය හැකි බව අපේක්ෂා කෙරේ. රැකියා සපයන්නන් අතර රැකියා පියස ජනප්‍රිය වීම තුළින් ඔවුන් රැකියා පියස මගින් ලබා ගන්නා සේවය සඳහා දනටමත් ඇති ගෙවීම් වැඩ සටහන නිසා ලැබෙන ආදායම ඉහළ යැමක් සිදුවේ.

ඒ අනුසාරයෙන් ශුද්ධ වියදම තවදුරටත් අඩු වේ. මීට අමතරව මෙම කර්තව්‍යය නිසා ඍජු ලෙස නොවුවත් ලැබෙන සමාජ ප්‍රතිලාභ නිසා රටට මේ සඳහා තවදුරටත් දැරිය යුතු ශුද්ධ වියදම අඩු වේ. මෙම සංකල්පය ලෝකයේ බොහෝ රටවල ඒ රටවල රජයන්ගේ සහයෝගයෙන් ක්‍රියාත්මකවීම සහ ශ්‍රී ලංකාවට ඇති ප්‍රතිලාභ සැලකිල්ලට ගනිමින් රජය මෙන්ම පෞද්ගලික අංශයද රැකියා පියස මගින් සැපයෙන සේවාවන් ප්‍රයෝජනයට ගත යුතුය.

වලට අනුව, රාජ්‍ය ආයතන වල එනම් මධ්‍යම රජය, පලාත් සභා සහ පලාත් පාලන ආයතන, සේවා නියුක්තිය 785,756 විය. අර්ධ රාජ්‍ය ආයතන එනම් රාජ්‍ය සංස්ථා, මණ්ඩල හා අධිකාරි වල සේවා නියුක්තිකයින්ගේ ගණන 257,452 ක් විය. රාජ්‍ය ආයතන හා අර්ධ රාජ්‍ය ආයතනවල සේවා නියුක්තිකයින්ගෙන් සමන්විත රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය 2002 වර්ෂයේ 1,061,399 සිට 2003 වර්ෂයේ 1,043,208 දක්වා පහත වැටුනි. ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය අංශයේ සේවා නියුක්ත සමීක්ෂණය මගින් මුළු රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වලින් සියයට 61 ක් ආවරණය වූ අතර 2003 වර්ෂය සඳහා ඇස්තමේන්තු කරන ලද මුළු සේවා නියුක්තයෙන් සියයට 93 ක් ආවරණය විය.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය සියයට 5 කින් පමණ අඩුවීම තුළින් මූලිකවම රජයේ මූල්‍ය කටයුතු ශක්තිමත් කිරීමේ වෑයමක් හා රජයේ ව්‍යවසාය ප්‍රතිසංස්කරණය කිරීමත් පිළිබිඹු වේ. තවද මෙමගින් රාජ්‍ය අංශයට බඳවා ගැනීම සීමා කිරීම සඳහා රජය ගන්නා උත්සාහය සනාථ කරයි. අර්ධ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය තවදුරටත් පහත වැටීමට මූලිකම හේතුවක් ලෙස ස්වේච්ඡාවෙන් විශ්‍රාම යැමේ වැඩ පිළිවෙල සඳහන් කළ හැක. 2003 වර්ෂයේ දී සාර්ථකව ස්වේච්ඡාවෙන් විශ්‍රාම යැමේ වැඩ පිළිවෙල ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම යන රාජ්‍ය අංශයේ ආයතන වල සේවා නියුක්තිය පිළිවෙලින් 4,481, 1,587 සහ 1,124 කින් අඩුවීම කෙරෙහි බලපාන ලදී. ස්වේච්ඡාවෙන් විශ්‍රාම යැමේ වැඩපිළිවෙල ක්‍රියාත්මක වූ ආයතන වල සේවා නියුක්තියෙහි අඩුවීම රාජ්‍ය අංශයේ මුළු සේවා නියුක්තියෙහි අඩුවීමෙන් සියයට 52 ක් විය. 2003 වර්ෂයේ දී මෙම ආයතන බොහෝමයක ක්‍රියාකාරකම් පුළුල්වීම හා ආර්ථික වර්ධනයට දැක් වූ දායකත්වය (2වැනි පරිච්ඡේදය බලන්න) සැලකීමේ දී කාර්යක්ෂමතාව හා ඵලදායිතාවයේ වැඩිවීමක් ස්වේච්ඡාවෙන් විශ්‍රාම යැමේ වැඩපිළිවෙල මගින් සිදු වී ඇති බව තහවුරු වේ.

මීට අමතරව බඳවා ගැනීම් සීමා කිරීමේ ප්‍රතිපත්තිය හා වයස 55-57 න් පසු සේවය දීර්ඝ නොකිරීමේ ප්‍රතිපත්ති මගින් දුම්රිය දෙපාර්තමේන්තුව වැනි රාජ්‍ය අංශයේ ආයතන වලද මහජන බැංකුව වැනි අර්ධ රාජ්‍ය අංශයේ ආයතන වලද සේවා නියුක්තිය පහත වැටුනි. තවද, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයිති වතුයායන් 3 ක් පෞද්ගලීකරණය කිරීම හේතුවෙන් ද එහි සේවා නියුක්තිය අඩුවීමක් දක්නට ලැබුණි.

කෘෂිකර්ම, දැව ආදී වන ද්‍රව්‍ය හා ධීවර කර්මාන්තය හා ප්‍රවාහන, ගබඩා කිරීම් සහ සන්නිවේදනය යන අංශවල සේවා නියුක්ති දායකත්වය 2002 තුන්වන කාර්තුවේ සිට 2003 තුන්වන කාර්තුව දක්වා කාලච්ඡේදය තුළ වැඩිවිය. මෙම කාලච්ඡේදය තුළ කෘෂිකර්ම, දැව ආදී වන ද්‍රව්‍යය හා ධීවර කර්මාන්ත අංශයේ සේවා නියුක්තිය 318,556 කින් වැඩිවිය. 2003 සාර්ථක යල කන්නය හේතුවෙන් 2002 වර්ෂය හා සැසඳු විට වී නිෂ්පාදනය සියයට 7.9 කින් හා වගා කල බිම් ප්‍රමාණය සියයට 11 කින් වැඩිවීම කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය ඉහළයාමට බෙහෙවින් බලපාන ලදී. එසේම නැගෙනහිර පලාත කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අයත් වීමද කෘෂිකාර්මික අංශයේ සේවා නියුක්තිය වැඩිවීමට දායක වූ අතර, එයට හේතුව කෘෂිකර්මාන්තය නැගෙනහිර පලාතේ ප්‍රධාන රැකියා උත්පාදනය කරන අංශයක් වීමය. 2003 වර්ෂයේ දී ඉදිකිරීම් අංශයේ සේවා නියුක්තිය 130,000 කින් පමණ වැඩි වූ අතර, එහි වර්ධනය සියයට 5.5 ක් විය. 2003 වර්ෂය තුළදී තවදුරටත් සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වීම තුළ උතුරු හා නැගෙනහිර පලාත් ද ඇතුලුව රටෙහි ඇති වූ සාමකාමී වාතාවරණය හා මාර්ග පද්ධතියෙහි සංවර්ධන කටයුතු ඉදිකිරීම් අංශයේ ක්‍රියාකාරීත්වය වැඩිවීම කෙරෙහි බලපාන ලදී. ප්‍රවාහන, ගබඩා සහ සන්නිවේදනය යන සේවා අංශයට අයත් උප අංශයේ සේවා නියුක්තිය ද වැඩි වූ අතර මෙය එම අංශයේ ඉහළ වර්ධන වේගයට සරිලන පරිදි වේ.

## 7.5 සේවා වියුක්තිය

2003 වර්ෂයේ සිට නැගෙනහිර පලාත කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය සඳහා ඇතුළත් කිරීමත් සමඟ සේවා වියුක්ති අනුපාතිකය 2002 හතරවන කාර්තුවේදී සියයට 7.5 සිට 2003 පළමු කාර්තුව සඳහා සියයට 9.2 දක්වා වැඩිවිය. කෙසේ නමුත් සේවා වියුක්ති දත්ත ශ්‍රේණිය ඡේදනය වීමෙන් පසුව ද 2003 වසර තුළදී සේවා වියුක්ති අනුපාතිකය ස්ථාපිත අගයකට පත් වූ අතර, මෙයට හේතු වූයේ 2002 වසරේ සිට තවදුරටත් ආර්ථිකය යථාතත්වයට පත්වීම තුළ නව ආර්ථික ක්‍රියාකාරකම් ඇතිවීම හා එමගින් රැකියා අවස්ථා උත්පාදනය වීමය. මෙය සේවා වියුක්ති අනුපාතිකය 2002 තුන්වන කාර්තුවේ සියයට 9.1 සිට 2003 තුන්වන කාර්තුවේ දී නැගෙනහිර පලාත ද ඇතුලුව සියයට 8.4 ක් දක්වා පහත වැටීම තුළින් පිළිබිඹු වේ.

කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණයට අනුව, උගත් තරුණ කොටස් අතර සේවා වියුක්ති අනුපාතිකය පසුගිය වසර කිහිපය තුළ වැඩිවීමේ ප්‍රවනතාවය වෙනස් කරමින් පහත වැටුණි. වයස 15-19 හා 20-29 වයස් කාණ්ඩවල සේවා වියුක්ති අනුපාතිකය 2002 තුන්වන කාර්තුවේ සිට 2003 තුන්වන කාර්තුව දක්වා පිළිවෙලින් සියයට 35.0 හා සියයට 20.4 සිට සියයට 29.9 හා සියයට 19.6 දක්වා අඩුවිය. ඒ අතර අ.පො.ස. (සා.පෙ.) සහ අ.පො.ස. (උ.පෙ.) හා ඊට වැඩි අධ්‍යාපනික සුදුසුකම් ඇති අංශවල සේවා වියුක්ති අනුපාතිකය 2002 තුන්වන කාර්තුවේ සිට 2003 තුන්වන කාර්තුව සඳහා පිළිවෙලින් සියයට 13.1 හා 17.3 සිට සියයට 11.2 හා 15.2 දක්වා අඩුවීම තුළින් ඉහළ අධ්‍යාපනික සුදුසුකම් අතර සේවා වියුක්ති අනුපාතිකය අඩුවීම පිළිබිඹු වේ.

උගත් තරුණ කොටස් තුළ තිබිය යුතු අධ්‍යාපනික සුදුසුකම් හා කුසලතාවයන් නොමැතිවීම ශ්‍රී ලංකාවේ තරුණ විරැකියා ප්‍රශ්ණයට ප්‍රධාන සාධකයක් ලෙස සැලකිය හැක. මෙම ප්‍රශ්ණයට පිලියමක් වශයෙන්, ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය විසින් තරුණ බල ඇණි වැඩසටහන 2003 වර්ෂයේ දී ආරම්භ කරන ලද අතර මෙමගින් වයස 18-28 කාණ්ඩයට අයත් තරුණයන් හට අවස්ථාවන් ලබාදීමට බලාපොරොත්තු වේ. මෙමගින් එම තරුණයන්ට නායකත්ව පුහුණුව ඇතුලු රැකියා කුසලතා අත්පත් කරදීම හා ගෝලීය වෙළෙඳ ආර්ථිකය තුළ සක්‍රීය ඵලදායි සමාජිකයන් වීමට අවශ්‍ය ආත්ම විශ්වාසය ලබාදීමට බලාපොරොත්තු වේ. හමුදාමය නොවන සංවිධානයක් වන මෙම තරුණ බල ඇණි වැඩ පිළිවෙල මගින් බලාපොරොත්තු

**7.7 සංඛ්‍යා සටහන**
**සේවා වියුක්ති අනුපාතිකය**
**(ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| වර්ෂය | සතියක විමර්ශන කාලය | | | | මාස 12 විමර්ශන කාලය |
|---|---|---|---|---|---|
| | පුරුෂ | ස්ත්‍රී | සමස්ත | ගෙවීමක් නොලද පවුලේ සේවකයින් හැර සමස්ත (අ) | සමස්ත |
| 1994 | 9.7 | 20.1 | 13.1 | 14.3 | 12.9 |
| 1995 | 8.8 | 18.8 | 12.3 | 13.4 | 12.0 |
| 1996 | 8.5 | 18.0 | 11.3 | 12.4 | 11.8 |
| 1997 | 7.7 | 16.1 | 10.5 | 11.5 | 11.6 |
| 1998 | 6.5 | 14.0 | 9.2 | 10.5 | 10.4 |
| 1999 | 6.7 | 13.0 | 8.9 | 10.0 | 9.1 |
| 2000 | 5.8 | 11.1 | 7.6 | 8.6 | 8.2 |
| 2001 | 6.2 | 11.5 | 7.9 | 8.8 | 8.2 |
| 2002 | 6.6 | 12.9 | 8.8 | 10.2 | 8.6 |
| පළමු කාර්තුව | 6.5 | 12.8 | 8.7 | 9.8 | 8.5 |
| දෙවන කාර්තුව | 7.3 | 14.8 | 9.8 | 10.8 | 9.9 |
| තෙවන කාර්තුව | 7.1 | 13.2 | 9.1 | 10.0 | 8.6 |
| සිව්වන කාර්තුව | 5.6 | 11.1 | 7.5 | 9.8 | 7.6 |
| 2003 (ආ) (ඇ) | 6.1 | 13.5 | 8.6 | 9.4 | 8.4 |
| පළමු කාර්තුව | 6.4 | 14.6 | 9.2 | 10.0 | 9.3 |
| දෙවන කාර්තුව | 5.7 | 13.1 | 8.1 | 8.9 | 7.9 |
| තෙවන කාර්තුව | 6.3 | 12.8 | 8.4 | 9.3 | 8.0 |

මූලයන් : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

(අ) ගෙවීමක් නොලද පවුලේ සේවකයන් ශ්‍රම බලකායෙන් ඉවත් කොට ඇස්තමේන්තු කළ සේවා වියුක්ති අනුපාතිකය
(ආ) කාර්තු තුනක සාමාන්‍යය
(ඇ) 2002 සිව්වන කාර්තුව දක්වා උතුර හා නැගෙනහිර දත්ත ශ්‍රම බලකා සමීක්ෂණයට ඇතුළත්කර නොමැත. 2003 පළමු කාර්තුවේ සිට නැගෙනහිර දත්ත ඇතුළත්කර ඇති අතර, උතුර තව දුරටත් සමීක්ෂණය සඳහා ඇතුළත්කර නොමැත.

**7.8 සංඛ්‍යා සටහන**

**වයස් කාණ්ඩ අනුව සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| වර්ෂය | වයස් කාණ්ඩ 15 - 19 | 20 - 29 | 30 - 39 | 40 - 49 | 50 සහ ඉහළ | සමස්ත |
|---|---|---|---|---|---|---|
| 1994 | 40.7 | 24.5 | 7.6 | 2.5 | 1.2 | 13.1 |
| 1995 | 37.6 | 22.2 | 8.0 | 2.9 | 0.4 | 12.3 |
| 1996 | 36.5 | 22.0 | 6.0 | 1.9 | 0.5 | 11.3 |
| 1997 | 34.0 | 21.9 | 5.2 | 1.7 | 0.6 | 10.5 |
| 1998 | 27.3 | 19.3 | 4.9 | 2.0 | 0.7 | 9.2 |
| 1999 | 28.4 | 18.9 | 4.4 | 1.6 | 1.0 | 8.9 |
| 2000 | 23.4 | 17.4 | 3.6 | 1.1 | | 7.6 |
| 2001 | 29.8 | 18.4 | 3.4 | 0.9 | | 7.9 |
| 2002 | 30.1 | 20.1 | 4.0 | 1.6 | | 8.8 |
| පළමු කාර්තුව | 22.9 | 18.7 | 5.7 | 1.4 | | 8.7 |
| දෙවන කාර්තුව | 34.0 | 23.2 | 3.4 | 1.5 | | 9.8 |
| තෙවන කාර්තුව | 35.0 | 20.4 | 3.1 | 1.1 | | 9.1 |
| සිව්වන කාර්තුව | 28.9 | 18.0 | 3.1 | 0.7 | | 7.5 |
| 2003 (අ) (ආ) | 30.5 | 19.9 | 3.9 | 1.1 | | 8.6 |
| පළමු කාර්තුව | 32.3 | 21.0 | 4.8 | 1.3 | | 9.2 |
| දෙවන කාර්තුව | 29.4 | 19.0 | 3.5 | 1.0 | | 8.1 |
| තෙවන කාර්තුව | 29.9 | 19.6 | 3.4 | 1.1 | | 8.4 |

(අ) කාර්තු තුනෙහි සාමාන්‍යය

(ආ) 2002 සිව්වන කාර්තුව දක්වා උතුර හා නැගෙනහිර පලාත්වල දත්ත ශ්‍රම බලකා සමීක්ෂණයට ඇතුළත් කර නොමැත. 2003 පළමු කාර්තුවේ සිට නැගෙනහිර පලාතෙහි දත්ත ඇතුළත්කර ඇති අතර, උතුරු පලාත තවදුරටත් සමීක්ෂණය සඳහා ඇතුළත්කර නොමැත.

මූලය : ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

වනුයේ මනාලෙස සැලසුම් කළ හා රැකියා ඉලක්ක කරගත් ඒකාබද්ධ පුහුනුවක් මගින් ස්ත්‍රී හා පුරුෂ යන දෙවර්ගයම ඉහළ හැකියා මට්ටමකට ගෙන ඒමය. මෙම ඒකාබද්ධ පුහුණු වැඩපිළිවෙල සඳහා නායකත්ව පුහුණුව, ඉංග්‍රීසි භාෂාව, පරිගණක හා තොරතුරු තාක්ෂණය, ඵලදායිතාව හා රැකියා මාර්ග උපදේශකත්වය, වෘත්තීය පුහුණු හා ව්‍යවසායකත්වය වැඩි දියුණු කිරීම ආදී ක්‍රියාකාරකම් ඇතුලත් වේ.

**7.9 සංඛ්‍යා සටහන**

**අධ්‍යාපන මට්ටම අනුව සේවා වියුක්ති අනුපාතිකය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස)**

| වර්ෂය | පාසල් අධ්‍යාපනයක් නොමැති | 0-4 ශ්‍රේණිය 1-5 වසර | 5-9 ශ්‍රේණිය 6-10 වසර | අ.පො.ස.(සා.පෙ.) ජා.පො.අ.ස. | අ.පො.ස.(උ.පෙ.) උ.ජා.අ.ස. සහ ඊට වැඩි | සමස්ත |
|---|---|---|---|---|---|---|
| 1994 | 2.6 | 5.0 | 13.0 | 19.6 | 23.7 | 13.1 |
| 1995 | 1.8 | 3.4 | 12.8 | 18.4 | 20.0 | 12.3 |
| 1996 | 2.8 | 3.4 | 12.2 | 16.4 | 19.0 | 11.3 |
| 1997 | 2.0 | 2.4 | 10.6 | 15.9 | 19.3 | 10.5 |
| 1998 | 1.0 | 2.4 | 9.0 | 13.7 | 17.5 | 9.2 |
| 1999 | 0.4 | 1.9 | 8.2 | 13.6 | 17.9 | 8.9 |
| 2000 | 1.0 | | 7.5 | 11.3 | 14.9 | 7.6 |
| 2001 | 1.3 | | 7.1 | 11.8 | 15.3 | 7.9 |
| 2002 | 1.8 | | 7.9 | 13.3 | 16.8 | 8.8 |
| පළමු කාර්තුව | 2.1 | | 8.0 | 12.0 | 16.7 | 8.7 |
| දෙවන කාර්තුව | 1.7 | | 8.1 | 15.3 | 20.3 | 9.8 |
| තෙවන කාර්තුව | 2.2 | | 8.4 | 13.1 | 17.3 | 9.1 |
| හතරවන කාර්තුව | 1.2 | | 7.2 | 12.4 | 12.9 | 7.5 |
| 2003 (අ) (ආ) | 1.8 | | 7.8 | 12.9 | 16.4 | 8.6 |
| පළමු කාර්තුව | 1.7 | | 8.1 | 14.8 | 18.1 | 9.2 |
| දෙවන කාර්තුව | 1.6 | | 7.0 | 12.8 | 15.9 | 8.1 |
| තෙවන කාර්තුව | 2.0 | | 8.3 | 11.2 | 15.2 | 8.4 |

මූලය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව

(අ) කාර්තු තුනෙහි සාමාන්‍යය

(අ) 2002 සිව්වන කාර්තුව දක්වා උතුර හා නැගෙනහිර පලාත්වල දත්ත ශ්‍රමබලකා සමීක්ෂණයට ඇතුළත් කර නොමැත. 2003 පළමු කාර්තුවේ සිට නැගෙනහිර පලාතෙහි දත්ත ඇතුළත්කර ඇති අතර, උතුරු පලාත තවදුරටත් සමීක්ෂණය සඳහා ඇතුළත්කර නොමැත.

**7.10 සංඛ්‍යා සටහන**
**තරුණ බල ඇණි වැඩසටහනෙහි ප්‍රගතිය 2003/2004**

| | ඉලක්ක 2003/2004 | 2004 පෙබරවාරි |
|---|---|---|
| තරුණයන් | 14,500 | 3,804 (අ) |
| තරුණ බල ඇණි මධ්‍යස්ථාන | 58 | 42 (ආ) |

මූලාශ්‍ර: ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය

(අ) තරුණ නායකයින් 831 හා තරුණයින් 2973 කින් සමන්විත වේ.
(ආ) 19 ක් දැනට ක්‍රියාත්මක වන අතර, 11 ක වැඩ අවසන් කොට හා 12 ක යටිතල පහසුකම් දියුණු කෙරෙමින් පවතී.

සමස්ථ වැඩසටහන පියවර තුනකට වෙන්කොට ඇත. පලමු පියවර මගින් තරුණයන් තම නිවස තුළ ජීවත් වූ වාතාවරණය වෙනස් කොට කණ්ඩායම් හැඟීම ඇති කැපවීම හා විනය ගරුක පිරිසක් බිහිකිරීමට අපේක්ෂා කෙරේ. මෙම පියවර මගින් සති 10 ක අනේවාසික පුහුණුවක් ලබාදෙනු ලැබේ. දෙවන පියවර සති 25 ක කාලයක් පවත්වනු ලබන අතර මෙමගින් පරිගණක හා ඉංග්‍රීසි භාෂාව පිළිබඳ පුහුණුවක් ලබාදෙන අතර සමාජ සංවර්ධන වැඩ කටයුතු සඳහා ද යොමු කරනු ලැබේ.

තුන්වන පියවර මගින් විශේෂයෙන් සහභාගිවන තරුණයන්ගේ කැමැත්ත පරිදි ව්‍යවසායකත්ව පුහුණුව ලබාදීම සඳහා කටයුතු කරනු ලබන අතර, මෙමගින් ඔවුන්ගේ රැකියා ලබාගැනීමට අවශ්‍ය කුසලතා දියුණු කිරීම හෝ තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය ශක්තිය ලබාදෙනු ඇත. මෙම පියවර තෘතියික අධ්‍යාපන හා ව්‍යවසායකත්ව පුහුණු අමාත්‍යාංශය, රැකියා පියස, ආයෝජන මණ්ඩලය හා විදේශ රැකියා ඒජන්සි සමග සම්බන්ධ කර ඇති අතර මෙමගින් සහභාගී වන තරුණයන්ගේ රැකියාවන් ලබා ගැනීමේ අවස්ථා වැඩි දියුනු වනු ඇත. විශේෂයෙන්ම මෙහිදී සහභාගීවන්නන් පෞද්ගලික අංශය වෙත හඳුන්වාදීම පලමු පියවර තුලදීම සිදුවීම ඉතා වැදගත් කොට සැලකිය හැකි අතර එමනිසා අනෙක් පියවර වලදී ද සහභාගීවන තරුණයන් සමග පෞද්ගලික අංශය සම්බන්ධවීම සිදුවනු ඇත.

ආරම්භයේ දී ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය මගින් මධ්‍යස්ථාන 160 සඳහා තරුණ නායකයින් 3000ක් ද සෑම මධ්‍යස්ථානයකට සේවා වියුක්ති තරුණයන් 250 බැගින් බඳවා ගැනීම තුළින් මුළු පිරිස 40,000 දක්වා වැඩිකර ගැනීමට මූලිකව තරුණ බල ඇණි වැඩසටහන මගින් බලාපොරොත්තු විය. ප්‍රයෝජනය සඳහා ගතහැකි යටිතල පහසුකම් භාවිතයෙන්, 2004 වර්ෂයේ දී ප්‍රතිපත්ති සම්පාදන හා ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය තරුණ බල ඇණි මධ්‍යස්ථාන 58 හා ඒ සඳහා තරුණයන් 14,500 ක් බඳවා ගැනීමට අපේක්ෂා කෙරිණි. මෙම වැඩසටහන මගින් තරුණයන් 831 ක් තරුණ නායකයින් ලෙස පුහුණු කිරීම 2003 මැයි මස ආරම්භ කරන ලදී. මෙම නායකයින් දිස්ත්‍රික්ක 11 ක් පුරා විහිදුනු තරුණ බල ඇණි මධ්‍යස්ථාන 19 ක පත්වීම් ලබා දී ඇත. 2003 නොවැම්බර් මාසයේ දී ආරම්භ වූ මෙම තරුණ බල ඇණි පුහුණු කිරීමේ මධ්‍යස්ථාන මගින් මුලින් තරුණයන් 2,973 ක් බඳවා ගන්නා ලදී. තරුණ නායකයින් ලෙස පුහුනු කරන ලද 831 දෙනා ද පුහුණු වැඩසටහන සඳහා බඳවා ගත් තරුණයන් සමඟම පුහුණුවීම් වැඩකටයුතුවල යෙදෙනු ඇත.

මෙම වැඩසටහන මාස 4ක් ක්‍රියාත්මක වී ඇති අතර එහි අරමුණු ආංශික ලෙස සම්පූර්ණ වී ඇත. මධ්‍යස්ථාන 19 ක දැනටමත් වැඩ කටයුතු කෙරෙන අතර මධ්‍යස්ථාන 11 ක් වැඩකටයුතු ආරම්භ කිරීමට සූදානම් කොට තිබේ. තවත් මධ්‍යස්ථාන 12 ක යටිතල පහසුකම් දියුණු කරමින් පවතින අතර, මෙමගින් දැනට ක්‍රියාත්මක වන හා ඉක්මනින් වැඩ ආරම්භ කල හැකි මුළු තරුණ බල ඇණි මධ්‍යස්ථාන ගණන 42 ක් වේ. ඉක්මනින් වැඩ ආරම්භ කළ හැකි මධ්‍යස්ථාන 23 සඳහා උතුර හා නැගෙනහිර පළාත්වල මධ්‍යස්ථාන ද අයත් වේ.

## 7.6 විදේශ සේවා නියුක්තිය

ශ්‍රී ලංකා විදේශ සේවා නියුතු කාර්යාංශයට අනුව 2003 වර්ෂයේ ලියා පදිංචි විදේශ රැකියා අවස්ථාවන් 2002 වර්ෂයට සාපේක්ෂව සියයට 2.3 කින් වැඩි වූ අතර, මෙයට අනුරූප 2002 සඳහා වැඩිවීම සියයට 10.7 ක් විය. 2002 වර්ෂය තුළ ලියාපදිංචි විදේශ රැකියා අවස්ථාවන් ගණන 203,773 හා සසඳන විට 2003 වර්ෂය සඳහා 208,439 ක් වුවද 2003 වර්ෂය සඳහා පුරෝකථනය කළ අගය වූ 210,000 ට වඩා අඩු අගයක් ගන්නා ලදී.

වාර්තා ගත විදේශ රැකියා සඳහා පිටව යන ලියා පදිංචි පිරිස වැඩිවීමේ වේගය ස්ත්‍රීන් සඳහා ඉහළ අගයක් ගන්නා ලදී. විදේශ රැකියා ප්‍රමාණය සැලකිය යුතු ලෙස වැඩිවන අවස්ථාවල ස්ත්‍රීන්ගේ දායකත්වය මූලිකවම බලපාන අතර ස්ත්‍රීන්ගේ දායකත්වය 1998 සිට 2002 දක්වා වර්ෂ 5 තුළ සියයට 65 ත් 67 ත් අතර පැවතිනි. 2003 වර්ෂයේ මෙම ප්‍රතිශත දායකත්වය සියයට 65 ට වඩා පහළ වැටිනි. 2003 වර්ෂයේ දී ගෘහ සේවිකාවන් 7500 කින් පමණ 2002 වර්ෂයට සාපේක්ෂව අඩු වුවද, අනික් ශ්‍රම කාණ්ඩ සියල්ලම, විශේෂයෙන් නුපුහුණු ශ්‍රමිකයන්ගේ වැඩිවීම විශේෂයෙන් සැලකිල්ලට භාජනය වේ.

ගෘහ සේවිකා ශ්‍රම කාණ්ඩය සඳහා අනෙකුත් රටවල් වලින් ලැබෙන තරගය වැඩිවෙමින් පවතින අතර, ශ්‍රී ලංකා බලධාරින්ගේ මතය වී ඇත්තේ එම ශ්‍රම කාණ්ඩයට ඇති පිරිස පුහුණුව ලබාදීම තුළින් ඔවුන් වෙනත් පුහුණු ශ්‍රමිකයන්ගේ ශ්‍රම කාණ්ඩ සඳහා යොමු කලයුතු බවයි. තවද කාන්තා කටයුතු අමාත්‍යාංශය විසින් ස්වයං රැකියා ආරම්භ

**7.11 සංඛ්‍යා සටහන**
**විදේශ සේවා නියුක්තිය**

| ශීර්ෂය | 1999 | 2000 | 2001 | 2002 | 2003(අ) |
|---|---|---|---|---|---|
| විදේශ රැකියා සංඛ්‍යාව | 179,735 | 182,188 | 184,007 | 203,773 | 208,439 |
| මූලයන් අනුව | | | | | |
| ලියාපදිංචි නියෝජිතයින් | 120,627 | 127,615 | 132,467 | 152,974 | 154,727 |
| (%) | (67) | (70) | (71) | (75) | (74 ) |
| වෙනත් | 59,108 | 54,573 | 51,540 | 50,799 | 53,712 |
| (%) | (33) | (30) | (28) | (25) | (26) |
| ස්ත්‍රී/පුරුෂ අනුව | | | | | |
| පුරුෂ | 63,720 | 59,793 | 59,807 | 70,522 | 74,117 |
| (%) | (35 ) | (33) | (33) | (35) | (36) |
| ස්ත්‍රී | 116,015 | 122,395 | 124,200 | 133,251 | 134,322 |
| (%) | (65 ) | (67) | (67) | (65) | (64) |
| ශ්‍රම කාණ්ඩ අනුව | | | | | |
| ගෘහ සේවිකා | 88,066 | 99,413 | 102,853 | 108,535 | 101,041 |
| (%) | (49) | (55) | (56) | (53) | (48) |
| පුහුණු ශ්‍රමිකයන් | 37,436 | 36,626 | 36,818 | 45,478 | 47,419 |
| (%) | (21) | (20) | (20) | (22) | (23) |
| නුපුහුණු ශ්‍රමිකයන් | 43,603 | 35,591 | 33,308 | 36,485 | 44,311 |
| (%) | (24) | (20) | (18) | (18) | (21) |
| වෙනත් | 10,630 | 10,558 | 11,028 | 13,275 | 15,668 |
| (%) | (6) | (6) | (6) | (7) | (7) |
| ලියාපදිංචි රැකියා නියෝජිත ආයතන (වර්ෂය අවසානයේ) | 500 | 445 | 528 | 538 | 526 |
| පුහුණුකිරීමේ මධ්‍යස්ථාන සංඛ්‍යාව | | | | | |
| විදේශ රැකියා කාර්යාංශය | 20 | 21 | 20 | 21 | 21 |
| පෞද්ගලික නියෝජිතයන් | 29 | 8 | 8 | 8 | 8 |

(අ) තාවකාලික දත්ත

මූලය : ශ්‍රී ලංකා විදේශ සේවානියුක්ති කාර්යාංශය

කිරීම සඳහා ස්ත්‍රීන් ධෛර්යමත් කරනු ලබන අතර මෙය විදේශගත වන සංක්‍රමණික කාන්තාවන් තම පවුල් තනිකර දමා යෑම නිසා උද්ගතවන සමාජ ආර්ථික ප්‍රශ්න අඩුකර ගැනීමට දරණ ප්‍රයත්නයකි. සමාජ ආර්ථික ප්‍රශ්ණවලට අමතරව සමහර ස්ත්‍රීන් හට හිරිහැරකිරීම් සිට මරණය පවා මුහුණ දීමට සිදුවේ. 2003 වර්ෂයේ දී කාන්තා කටයුතු අමාත්‍යංශය, කර්මාන්ත සංවර්ධන මණ්ඩලයේ ද සහයෝගය ඇතිව කාන්තාවන් හට ව්‍යවසායකත්ව පුහුණුව හා තිබෙන සම්පත්වලට අනුව හා වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන පරිදි ස්වයංරැකියා වැඩ සටහන් සම්පාදනය සඳහා පුහුණුව ලබාදීම සඳහා වැඩසටහනක් සම්පාදනය කරන ලදී. මුල් පියවරක් ලෙස කාන්තා කටයුතු අමාත්‍යංශය මගින් දීපව්‍යාප්ත දැනුවත් කිරීමේ වැඩ පිළිවෙලක් පළමු වරට විදේශ රැකියාවන් හට හා කිහිප වාරයක් විදේශ ගත වී ඇති සංක්‍රමණික කාන්තාවන් හට ආරම්භ කරන ලදී.

සංක්‍රමණික සේවකයින් මුහුණ දෙන ප්‍රශ්ණ අවම කිරීම සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ත කාර්‍යාංශය මගින් මැලේසියාව සමග ඔවුන්ගේ ආරක්ෂාව හා සුභ සාධනය තහවුරු කරන පරිදි ගිවිසුමක් අත්සන් කරන ලදී. ඇමරිකන් ඩොලර් 5,000 ක රක්ෂණ ආවරණයක් හා සුමානයකට දවසක් නිවාඩු දීම සේවක අයිතියක් ලෙස සැලකීම ගිවිසුමේ ප්‍රධාන කරුණු ලෙස සැලකිය හැක. මීට අමතරව කම්කරුවන් ඉල්ලුම් කරන ඒජන්සි ඇමරිකන් ඩොලර් 50,000 ක මුදලක් ශ්‍රී ලංකා කම්කරු අමාත්‍යංශය වෙනුවෙන් එම රටේ පෙනීසිටින කාර්යාලයක තැන්පතු කල යුතුවේ. මෙම මුදල විශේෂයෙන් සංක්‍රමණික සේවකයන්ගේ ආරක්ෂාව හා සේව්‍යයන් ගෙවීම් කලට වේලාවට නිත්‍ය ලෙස සිදු කිරීම තහවුරු කෙරේ. සංක්‍රමණික සේවකයින්ගේ පවුල්වල සුබසාධන කටයුතු සඳහා ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය තවදුරටත් සංක්‍රමණිකයින්ගේ දූ දරුවන්ට ශිෂ්‍යත්ව ක්‍රමයක් හා පාසල් නිල ඇඳුම් ලබා දෙන ලදී. මුළු ශිෂ්‍යත්ව ගණන 2002 වර්ෂයේ 1,594 සිට 2003 වර්ෂයේ 1,671 දක්වා හා පාසල් නිල ඇඳුම් ළමුන් 8,846 කට මිලියන 9.3 ක වියදමින් ලබාදෙන ලදී.

2001 වර්ෂයේ සිට විදේශ රැකියා ඉපයීම් සියළු කෘෂිකාර්මික ආනයන වලින් උපයන ප්‍රමාණයට වඩා ඉහළ අගයක් ගනු ලැබීය. 2003 වර්ෂයේ දී ශුද්ධ පෞද්ගලික සංක්‍රාම, මූලිකවම මැද පෙරදිග රටවල සංක්‍රාමික ආදායම වන අතර මෙය රටෙහි ජාතික තැන්පතුවලින් සියයට 30 ක් විය.